**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය - 2016**

-----------------------------------------------------

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනතේ 20(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයෙහි අධිකාරියේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2015 සහ 2016 වර්ෂවලට අදාල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

-----------------------------------

අධිකාරිය විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2014 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම** |
|---|---|
| | **රු.** |
| <u>වත්කම්</u> | |
| ජංගම නොවන වත්කම් | 16,752,897 |
| ජංගම වත්කම් | 2,492,381 |
| | ------------- |
| මුළු වත්කම් | 19,245,278 |
| | ======= |

| | |
|---|---|
| <u>ස්කන්ධය හා වගකීම්</u> | |
| ස්කන්ධය | 3,705,071 |
| <u>වගකීම්</u> | |
| ජංගම නොවන බැරකම් | 13,840,972 |
| ජංගම බැරකම් | 1,699,235 |
| | ------------ |
| මුළු බැරකම් | 19,245,278 |
| | ======== |
| මුළු ආදායම | 30,592,712 |
| මුළු වියදම | 27,064,820 |
| | -------------- |
| අතිරික්තය | 3,527,892 |
| | ======== |

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 110 | හානි පිළිබඳව ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 සහ 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (*) අත්තිකාරම් ලබා දීමේදී අදාළ ගණුදෙනුව සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම මත නිකුත් කළ අත්තිකාරම් මුදලින් සියයට 30 කට වඩා වැඩි ප්‍රමාණයක් ඉතිරි වූ අවස්ථා 35 ක් නිරීක්ෂණය වූ අතර එම වටිනාකම රු.351,796 ක් විය. මෙය නිකුත් කළ අත්තිකාරම් මුදල් ප්‍රමාණයෙන් සියයට 49 ක් විය.<br><br>(*) මාස 01 සිට මාස 05 අතර කාලයක ප්‍රමාදයෙන් පසුව අත්තිකාරම් පියවා තිබූ අවස්ථා 37 ක් වූ අතර එම වටිනාකම රු.6,900,305 ක් විය.<br><br>(*) අත්තිකාරම් අවශ්‍ය වන දිනට වඩා සැලකිය යුතු දින ගණනකට පෙර අත්තිකාරම් මුදල් ලබාදී තිබුණ අවස්ථා 09 ක් නිරීක්ෂණය වූ අතර එහි වටිනාකම රු.177,117 ක් විය. |

(*) 2016 නොවැම්බර් 30 දින සිට දෙසැම්බර් 31 දක්වා වන කාලපරිච්ඡේදය තුළ විශේෂ වැඩසටහන් ලෙස දක්වමින් අත්තිකාරම් ලබා දී තිබූ අවස්ථා 52 ක් නිරීක්ෂණය වූ අතර එහි වටිනාකම රු.30,055,550 ක් විය. එය මෙම වර්ෂය තුළ දුන් මුළු අත්තිකාරම් මුදලින් සියයට 84 ක් වූ අතර මෙම අත්තිකාරම්වලින් රු.11,399,000 ක් 2018 සැප්තැම්බර් 14 දින වන විටත් පියවා නොතිබුණි.

| | | |
|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 756 සහ 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අධිකාරියේ බඩු බාහිරාදිය හා ස්ථාවර වත්කම් පිළිබඳව 2016 වර්ෂය වෙනුවෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

### 3.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනත අනුව අධිකාරියේ පහත දැක්වෙන අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි 2016 වර්ෂයේදීද අවධානය යොමු කර නොතිබුණි.

(i) පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විදේශ වෙළඳපලවල් ජයග්‍රහණය කිරීමට හැකි දේශීය ව්‍යවසායන් ජාත්‍යන්තරකරණය කිරීමේ අරමුණින් ව්‍යවසායන් ශ්‍රී ලංකාවෙන් පිට පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම උනන්දු කරවීම සඳහා දිරි ගැන්වීම.

(ii) තාක්ෂණික දියුණුව, නිෂ්පාදන සංවර්ධනය සහ පේටන්ට් අයිතියේ වාණිජකරණයට අදාල පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සංවර්ධන අරමුදලක් පිහිටුවීම.

**3.2** සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ කාර්යයන්හි ප්‍රගතිය පහත පරිදි විය.

(අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් සඳහා තොරතුරු ලබාදීමේ අරමුණින් ප්‍රවෘත්ති පත්‍රිකා 4 ක් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රකාශයට පත්කිරීමට සැලසුම් කර තිබුණද එක් ප්‍රවෘත්ති පත්‍රිකාවක් පමණක් නිකුත් කර තිබුණි.

(ආ) 2016 වර්ෂය තුළදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සම්බන්ධයෙන් වැදගත් වන තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් නිර්මාණය කොට පවත්වාගෙන යාමට සැලසුම් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ එහි ප්‍රගතිය සියයට 50 ක් විය.

(ඇ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් හා ආයෝජකයන් වැනි පාර්ශවයන්ට ව්‍යාපාර කටයුතු කර ගෙන යාමේදී මුහුණ පෑමට සිදුවන ගැටළු නිරාකරණය කිරීම මහපෙන්වීම අරමුණු කර ගෙන ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ව්‍යාපාර සංසද පැවැත්වීමට අපේක්ෂා කර තිබූ අතර ඒ සඳහා වෙන් කර තිබූ රු.270,000 ක් වූ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම උපයෝජනය කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේ දී ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් මට්ටමේ ව්‍යාපාර සංසද පැවැත්වීමේ භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 25 ක් හා සියයට 20 ක් සහ පවත්වන ලද ව්‍යාපාර සංසද ප්‍රමාණය 11 ක් විය.

(ඇ) රු.50,000 ක් වැය කරමින් සමාලෝචිත වර්ෂය තුළදී ජාතික මට්ටමින් ව්‍යාපාර සංසඳ පැවැත්වීම සඳහා ප්‍රතිපාදනය කර තිබුණද සමාලෝචිත වර්ෂයේ ව්‍යාපාර සංසඳ කිසිවක් පවත්වා නොතිබුණු නමුත් වෙන්කළ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක් උපයෝජනය කර තිබුණි.

(ඉ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට වෙළඳපොළ අවස්ථා සුලභ කිරීමේ අරමුණින් ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් කාර්මික හා ව්‍යාපාරික වෙළඳපොළවල් 02 බැගින් පැවැත්වීමට සැලසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.420,000 ක් මෙම වැඩසටහන සඳහා වෙන් කර තිබූ අතර වෙන් කල ප්‍රතිපාදනවලින් සියයට 74 ක් එනම් රු.314,000 ක් වැයකර ප්‍රාදේශීය මට්ටමින් ව්‍යාපාරික වෙළඳපොළවල් 02 ක් පවත්වා තිබුණි. ජාතික මට්ටමින් කාර්මික හා ව්‍යාපාරික වෙළඳපොළවල් පැවැත්වීමට කටයුතු කර නොතිබුණු අතර මෙම වැඩසටහනින් අත්කරගත් ප්‍රගතිය අපේක්ෂිත අරමුණින් සියයට 50 ක් විය.

(ඊ) සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ඉලක්ක කර ඔවුන්ගේ ව්‍යවසායකත්ව දැනුම ප්‍රවර්ධනය කිරීම සඳහා 2016 වර්ෂය තුළ රු.500,000 ක ප්‍රතිපාදන යටතේ සහතික පත්‍ර පාඨමාලා හා වැඩමුළු 03 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී එක් පාඨමාලාවක් ආරම්භ කර තිබූ අතර ඒ සඳහා කිසිඳු පිරිවැයක් දරා නොතිබුණු අතර වැඩසටහනෙහි ප්‍රගතිය සියයට 25 ක් විය.

(උ) යුද්ධයෙන් අවතැන්වූ වැන්දඹුවන් සාර්ථක ව්‍යවසායකයින් බවට පත්කර ඔවුන්ගේ ජීවනෝපාය සංවර්ධනය කිරීමේ අරමුණින් 2016 වර්ෂය තුළදී වැන්දඹුවන් 50 දෙනෙක් ප්‍රවර්ධනය කිරීමට සැලසුම් කර තිබූ අතර මේ සඳහා වෙන්කළ ප්‍රතිපාදනය රු.250,000 ක් විය. මෙම සම්පූර්ණ ප්‍රතිපාදනය උපයෝජනය කර තිබුණද, අවශ්‍යතා සහිත වැන්දඹුවන් හඳුනා ගැනීමේ සමීක්ෂණයක් පමණක් පවත්වා තිබූ අතර වැඩසටහනෙහි ප්‍රගතිය සියයට 10 ක් පමණක් විය.

(ඌ) පාසල් ළමුන් අතර ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර තිබූ වැඩසටහන 2016 වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(එ) වයඹ, සබරගමුව, ඌව වෙල්ලස්ස, ජයවර්ධනපුර, රුහුණ, යාපනය හා පේරාදෙණිය යන විශ්ව විද්‍යාලවල උපාධිධාරීන් 250 ක් පුහුණු කිරීම හා ඒ අතුරින් උපාධිධාරීන් 25 දෙනෙකු ව්‍යවසායකයින් බවට පත්කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර තිබූ වැඩසටහනෙහි ඇස්තමේන්තුගත පිරිවැය රු.1,200,000 ක් විය. මේ සඳහා වෙන් කළ ප්‍රතිපාදනවලින් සියයට 98 ක් උපයෝජනය කර තිබූ නමුත් වැඩසටහනේ ප්‍රගතිය සියයට 50 ක් විය.

## 3.3 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 32 දෙනෙකු හා තථ්‍ය සේවක සංඛ්‍යාව 22 දෙනෙකු වීමෙන් පුරප්පාඩු 10 ක් පැවති අතර 2017 වර්ෂයේදී එම පුරප්පාඩුවලින් 02 ක් පිරවීමට කටයුතු කර තිබුණි.

(ආ) අධිකාරියේ රියදුරෙකු කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණු අතර 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වැටුප් හා දීමනා ලෙස රු.967,752 ක්ද අතිකාල හා ගමන් වියදම් ලෙස රු.252,310 ක් ද අධිකාරිය විසින් ගෙවා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකාව තුළ කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධනය උනන්දු කරවීම, වැඩිදියුණු කිරීම සහ පහසුකම් සැලසීම මගින් ශ්‍රී ලංකා ආර්ථික වර්ධනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා දිරිගැන්වීම අධිකාරියේ ප්‍රධාන අරමුණු වුවත්, එම අරමුණු ඉටුකිරීම සඳහා සෘජුව බලපානු ලබන ව්‍යවසාය ප්‍රවර්ධන නිලධාරීන් හා ව්‍යවසාය ප්‍රවර්ධන සහකාර නිලධාරීන්ගේ අනුමත තනතුරු 13 න් 08 ක්ම 2017 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි.

## 4. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිලිබඳව වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) පොත්පත් හා ලේඛන පවත්වා ගැනීම | විගණන විමසුම් ලේඛනයක් පවත්වා නොතිබීම. |
| (ආ) අත්තිකාරම් | අත්තිකාරම් පියවීම ප්‍රමාද වීම. |